සමාජ සේවා, සුභසාධන හා

පශුසම්පත් සංවර්ධන අමාත්‍යාංශය

චක්‍රලේඛ I /3/ 2015 NSPD

2015.04.27

දිස්ත්‍රික් ලේකම්
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

.................................................

**<u>2015 අයවැය යෝජනා අනුව අඩු ආදායම් ලාභී ආබාධ සහිත පුද්ගලයන් සඳහා රු.3000 ජීවනාධාර දීමනාව ගෙවීම</u>**

01. 2015 අයවැය යෝජනා අනුව අඩු ආදායම් ලාභී ආබාධ සහිත පුද්ගලයන් වෙනුවෙන් ජීවනාධාර ලබාදීම සඳහා 2015 ජනවාරි 01 නිකුත්කරන ලද අංක 3/2015 NSPD දරණ චක්‍රලේඛය මින් අහෝසිවන අතර ඒ වෙනුවට I /3/ 2015 NSPD දරණ චක්‍රලේඛය වලංගු වේ.

ආබාධ සහිත පුද්ගලයන් සඳහා රු. 3000/- බැගින් ජීවනාධාර මාසික දීමනාව ලබාදීම සඳහා පහත ක්‍රමවේදය අනුගමනය කල යුතුය.

**02. දීර්ඝ කාලීනව කායික, මානසික, බුද්ධිමය හෝ හැඟීම් දැනීම් වල ඌනතාවයන් සහිත භෞතික පරිසරයේ විවිධ වූ බාධාවන් නිසා දෛනික ක්‍රියාකාරීත්වය සීමා වූවන් ආබාධ සහිත පුද්ගලයන් සේ සලකනු ලබයි.**

ඉහත හැදින්වීමට අනුව, ආබාධ සහිත පුද්ගලයන්ගේ ආබාධිත භාවය පැහැදිලිව දෘශ්‍යමාන වන අවස්ථා වලදී, වෛද්‍යවරයෙකුගේ නිර්දේශයකින් තොරව සමාජ සේවා නිලධාරී/ සමාජ සංවර්ධන සහකාර/ සංවර්ධන නිලධාරී හට ජීවනාධාර ලබා දීම නිර්දේශ කළ හැකිය. එසේ කළ නොහැකි සෑම අවස්ථාවකදීම රජයේ රෝහලක වෛද්‍යවරයෙකුගෙන් පමණක් ආබාධිතතාවය පිළිබඳ වාර්තාවක් ලබා ගත යුතුය.

**03. මෙම දීමනාව මාසික දීමනාවක් බැවින් සෑම මසකම 20 වන දිනට ප්‍රථම ගෙවීම් කල යුතුය**

ආධාරලාභීන් තෝරාගැනීමේ ක්‍රමවේදය.

01. ඉහත නිර්වචනයට අනුව තමන්ගේ කටයුතු කරගත නොහැකි හෝ අන් අයෙකුගේ සහය ඇතිව කටයුතු කරන ආබාධ සහිත පුද්ගලයන් මෙම ආධාරය ලැබීමට සුදුස්සන් වෙති.

02. ප්‍රතිලාභීන් තෝරා ගැනීමේදී, ප්‍රමුඛතා ලේඛණ සැකසීමේදී හෝ අභියාචනා සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේදී අවසන් තීරණ ගැනීම සඳහා ප්‍රාදේශීය ලේකම්, සමාජ සේවා නිලධාරී, සමාජ සංවර්ධන සහකාර, සංවර්ධන නිලධාරී හෝ ඒ ආශ්‍රිත නිලධාරීන් 03 දෙනෙකුගෙන් සමන්විත කමිටුවක් පත්කරගත යුතුය.

03. එක නිවසක් තුල සිටින කණ්ඩායමක් පවුලක් ලෙස සලකන අතර, පවුලේ මාසික ආදායම රු. 3000/- හෝ 3000/- ට වඩා අඩුබව ග්‍රාම නිලධාරී විසින් නිර්දේශ කල යුතුය. යි. (ආදායම් සීමාව සැලකීමේදී පවුලේ පුද්ගලික ඉපයීම් ආදායම් ලෙස සැලකිය යුතු අතර රජයේ ආධාර ආදායමක් ලෙස නොසැලකිය යුතුය.)

04. රැකබලා ගැනීමට කිසිවෙකුත් නොමැති ආබාධ සහිත පුද්ගලයන් රජයේ ආධාර නොලබන ආයතනයක ස්ථිරවම නිවාසගතකර ඇත්නම් රුපියල් 3000/-ක ආධාරයක් හිමිවේ.

05. පාසැල් අධ්‍යාපනය ලබන ශිෂ්‍යාධාර රු,750.00 ලබන දරුවන් සඳහා මෙම ආධාරය ලබාදීම බාධාවක් නොවේ.

06. ආබාධ සහිත පුද්ගලයන් සඳහා ජීවනාධාරය ලබා දිමේදී වකුගඩු ආධාරය හෝ වැඩිහිටි දීමනාව ලබා දීම බාධාවක් නොවේ.

07. හදිසි අනතුරු හෝ ලෙඩ රෝග නිසා තාවකාලිකව ආබාධිත වන පුද්ගලයින් මෙම ආධාරය ලැබීමට සුදුස්සන් නොවේ.

08. වයස්ගතවීම හෝ රෝගී තත්වයන් නිසා ඇතිවන දුර්වලතාවයන් මෙම ආධාරය ලැබීමට සුදුසුකමක් නොවේ. (රෝගී පුද්ගලයන් හා වැඩිහිටියන් සඳහා වෙනමම ආධාර ක්‍රම ක්‍රියාත්මක වේ. )

09. රජයේ වියදමින් වෘත්තීය පුහුණු ආයතනයක පුහුණුව නිමවා රැකියාව සඳහා සියළු හිමිකම් ලබාගෙන ඇති පුද්ගලයෙකු මෙම ආධාරය ලැබීමට සුදුස්සකු නොවේ.

10. යම් ප්‍රතිලාභියෙක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයෙන් බැහැරව පදිංචි වුවහොත්, මියගියහොත් හෝ අඛණ්ඩව මාස තුනක් මුදල් ලබා නොගතහොත් කඩිනමින් ගෙවීම් නැවැත්විය යුතුයි.

11. ආබාධ සහිත පුද්ගලයා හෝ ඔහු වෙනුවෙන් ආදායම් උත්පාදක කාර්යයක යෙදීමට අදහස් කරන පවුලේ කෙනෙකුට ස්වයං රැකියා ආධාරය ලබාදිය හැකි අතර සමාජ සේවා නිලධාරි , සමාජ සංවර්ධන සහකාර හෝ සංවර්ධන නිලධාරී විසින් ප්‍රගතිය හා එහි ආදායම් තත්වය සලකා බලා ස්වයං රැකියාව ආරම්භ කර වසරක් තුල ජීවනාධාරය අවලංගු කළ යුතු වේ.

12. පවුලේ පූර්ණ ආබාධ සහිත පුද්ගලයන් කිහිපදෙනෙකු සිටින විට එම පුද්ගලයන්ට ආධාර ලබාදීමට කමිටුවේ තීරණය ලබා ගත යුතුය. එසේ නොවන අවස්ථාවලදී පවුලේ එක් පුද්ගලයෙකුට පමණක් හිමිවේ.

13. ඉහත ක්‍රමවේදයන්ට අදාලව ඉල්ලුම් පත්‍රය (ඇමුණුම් අංක **01**) සම්පූර්ණ කර තෝරා ගැනීම කල යුතුය. තෝරාගත් ඉල්ලුම් පත්‍ර සමාජ සේවා නිලධාරීගේ නිර්දේශය සහිතව සහ ප්‍රාදේශීය ලේකම්ගේ අනුමැතිය සහිතව මේ සමඟ අමුණාඇති (ඇමුණුම් අංක **05**) ආකෘති පත්‍රයේ දක්වා ඇති ලකුණු ලබාදීමේ ක්‍රමවේදය අනුගමනය කරමින් ඒ ඒ ආබාධ සහිත පුද්ගලයා උපයා ගන්නා ලකුණු ප්‍රමාණය මත ප්‍රමුඛතා ගත කර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ තබාගෙන නිර්දේශිත නාම ලේඛණය පමණක් (ඇමුණුම් අංක **02**) ආකෘති පත්‍රයට අනුව සකස්කර සමාජ සේවා, සුභසාධන හා පශුසම්පත් අමාත්‍යාංශයේ අනුමැතියට ඉදිරිපත් කල යුතුය. චක්‍රලේඛය අනුව තවදුරටත් ආධාර ලැබිය යුතු පුද්ගලයන් සිටීනම් ප්‍රමුඛතා ලේඛණයට අනුව අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කල යුතුය.

14. සෑම වසරකම මාර්තු 31ට පෙර ජීවනාධාර ලාභීන් පිළිබඳව නැවත සමීක්ෂණයක් සිදු කර සංශෝධිත වාර්තාව කමිටුවේ එකඟතාවය මත අප්‍රේල් 30 වන දාට පෙර අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කොට අනුමැතිය ලබා ගත යුතුය. (සමීක්ෂණ පත්‍රිකාව ඇමුණුම් අංක **04** අනුව ඉදිරිපත් කල යුතුය.) තවද මෙතෙක් ආධාර ලැබූවන් වේ නම් ඔවුන්ද අදාළ සංශෝධනයට යටත් කල යුතුය. මීට අමතරව සෑම මාස තුනකට වරක් මේ සමඟ අමුණා ඇති (ඇමුණුම් අංක **03**) ආකෘති පත්‍රයට අනුව ඔබ කොට්ඨාශයේ ජීවනාධාරලාභීන්ගේ ගෙවීම් කටයුතුවල සංඛ්‍යාත්මක ප්‍රගතිය අමාත්‍යාංශය වෙත දැනුම් දිය යුතුය.

15. නියෝජිතයකු මඟින් ආධාර මුදල් ලබා ගන්නේ නම් මාසිකව ග්‍රාම නිලධාරි වාර්තාවක් ලබා ගෙන ඉදිරිපත් කළ යුතුය.

16. ගෙවීම් ලේඛණයට නව ඇතුලත්වීම් සිදුවන සෑම අවස්ථාවකදීම හා ගෙවීම් නතර කරන ලද අවස්ථාවලදී ඇමුණුම් අංක 04 ආකෘති පත්‍රය මඟින් එය අමාත්‍යාංශය වෙත දැනුම්දී අනුමැතිය ලබාගතයුතු අතර නව ඇතුලත්වීම් වලට නව පිළිවෙල අංකයක් ලබාදිය යුතුයි.

17. අදාල ප්‍රතිපාදන වෙන්කර ඔබ වෙත මෙම අමාත්‍යාංශය විසින් එවනු ලැබේ. ප්‍රතිපාදන ලැබීමෙන් පසු අක් මුදල් භාණ්ඩාගාරයෙන් ලබාගත යුතුයි. ගෙවීම් කල යුත්තේ ප්‍රමුඛතාවය අනුව ප්‍රාදේශීය ලේකම් විසින් නිර්දේශ කර

මෙම අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කොට අනුමැතිය ලබාගත් නාම ලේඛණයේ සඳහන් ආබාධ සහිත පුද්ගලයන්ට පමණි. ( ඇමුණුම් අංක 2 )

18. ගෙවන වවුචර්පත් වල මුල් පිටපත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ගොනුකොට තබාගත යුතුය.

19. මෙම වැඩසටහන සාර්ථකව ඉටුකිරීම සඳහා ප්‍රාදේශීය ලේකම්වරුන්ගේ සහ සමාජ සේවා නිලධාරීන්ගේ, සමාජ සංවර්ධන සහකාරවරුන්ගේ ,සංවර්ධන නිලධාරීන්ගේ සහ ග්‍රාම නිලධාරීන්ගේ සහය අත්‍යාවශ්‍ය වන අතර, මේ සම්බන්ධයෙන් අමතර තොරතුරු අවශ්‍ය වේ නම් සමාජ සේවා, සුභ සාධන හා පශු සම්පත් සංවර්ධන අමාත්‍යාංශයේ ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික මහ ලේකම් කාර්යාලයෙන් ලබාගත හැකිය.

| | | |
|---|---|---|
| **දුරකථන අංක -** | **අධ්‍යක්ෂ** | **- 0112863416** |
| | **සහකාර අධ්‍යක්ෂ** | **- 0112877128** |
| | **කාර්යාලය** | **- 0112877374** |

මේ සම්බන්ධයෙන් ඔබෙන් ලැබෙන සහය ඉතා අගය කොට සලකමි. මෙම චක්‍රලේඛය 2015 ජනවාරි 01 දින සිට බලපැවැත්වෙන බව කාරුණිකව සලකන්න.

**රේණුකා ඒකනායක**
**ලේකම්**

**පිටපත් :-**

| | |
|---|---|
| 01. ලේකම් - මුදල් අමාත්‍යාංශය | - කරු. දැ.ගැ.ස |
| 02. ලේකම් - රාජ්‍ය පරිපාලන හා ස්වදේශීය කටයුතු අමාත්‍යාංශය | - කරු. දැ.ගැ.ස |
| 03. ලේකම් - සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය | - කරු. දැ.ගැ.ස |
| 04. පළාත් ප්‍රධාන ලේකම්වරු | - කරු. දැ.ගැ.ස |
| 05. විගණකාධිපති | - කරු. දැ.ගැ.ස |
| 06. සියළුම දිස්ත්‍රික් ලේකම්වරු | - කරු. දැ.ගැ.ස |
| 07. සමාජ සේවා අධ්‍යක්ෂ | - කරු. දැ.ගැ.ස |
| 08. පළාත් සමාජ සේවා අධ්‍යක්ෂකවරු | - කරු. දැ.ගැ.ස |
| 09. සියළුම ප්‍රාදේශීය ලේකම්වරු | - කරු. අ.ක.ස |
| 10. ප්‍රධාන ගණකාධිකාරී - සමාජ සේවා, සුභ සාධන හා පශු සම්පත් සංවර්ධන අමාත්‍යාංශය | - කරු. අ.ක.ස |
| 11. ප්‍රධාන අභ්‍යන්තර විගණක - සමාජ සේවා, සුභ සාධන හා පශු සම්පත් සංවර්ධන අමාත්‍යාංශය | - කරු. අ.ක.ස |